# සරසවි ගිය සමුද්‍රිකාට දෙවියන් හමුවීම

සන්නස ඉකුත් කලාප තුළින් පාඨක ඔබ වෙත වාර්තා කළ ''සමුද්‍රිකාගේ කතාව'' කියැවූ සහෘද පාඨක මහත්ම මහත්මීන් කිහිප දෙනෙක් ඊට දක්වා ඇති ප්‍රතිචාර බෙහෙවින් සාධනීය වේ. කරුණාව, දයාව, මිනිසත්බව ආදී උතුම් ගුණයෙන් පෝෂණය වූ හදවත් ඇති එවන් මිනිසුන්ගේ අවධානය සමුද්‍රිකා වෙත යොමුවීම ඇය ලද භාග්‍යයකි. එවන් සහෘදයන් කිහිප දෙනෙකු හෝ සන්නස පාඨක සමාජය තුළ සිටීම සන්නසටද අභිමානයකි. මේ වන විට සමුද්‍රිකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපන කටයුතු අරඹා ඇති බවත්, සන්නස සහෘද පාඨකයන්ගෙන් ලැබුණ උපකාර එහිදී ඇයට මහත් පිළිසරණක්වී ඇති බවත් ඇය අප වෙත දන්වා තිබේ.

සන්නස මුල්වරට සමුද්‍රිකා පිළිබඳ කෙටි සටහනක් තැබුවේ ජනවාරි කලාපයේය. කිසියම් පරිත්‍යාගශීලියෙකුට හැකියාවක් ඇත්නම් ඇයගේ අධ්‍යාපන කටයුතුවලට අතදීමක් වශයෙන් පරිගණකයක් ලබාදෙන ලෙස වූ ඇයගේ ඉල්ලීම අපි එහි සටහන් තැබුවෙමු. එපුවත පලවීමෙන් පසු අපගේ සහෘද පාඨකයන් දෙදෙනෙකු ඈ පිළිබඳ කරුණු විමසා තිබිණ.

Edward Theophilus එක් සහෘද මහත්මයෙකි. ඔහු ඇයට පරිගණකයක් ලබාදීමට කැමැත්ත පළකර ඈ පිළිබඳ වැඩිදුර තොරතුරු විමසීමක් සිදුකර තිබුණි. ඒ අනුව තොරතුරු ලබාදුන්නද කිසියම් හේතුවක් නිසා ඒ මහතාට දුරකථනයෙන් ඇය හා සම්බන්ධවීමට නොහැකි වී ඇත. එබැවින් ඒ මහතාගේ පරිත්‍යාගය ඇය වෙත ලබාදීමට නොහැකි වී ඇති අතර මේ වන විට ඒ මහතා ඕස්ට්‍රේලියාවේ නොමැති බව අප වෙත දන්වා තිබේ.

ඕස්ට්‍රේලියාවේ වෙසෙන තවත් කාරුණික මහත්මයෙක් දුරකථනයෙන් ඇය අමතා උදව් කිරීමට කැමැත්ත පලකර තිබිණ. ඇයගේ තොරතුරු ග්‍රාම නිලධාරි, විදුහල්පති ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගෙන් සහතික කර එවන ලෙස ඇයට දැනුම්දී තිබිණ. ඒ අනුව ඇය ලබාගත් සහතික කිරීමේ ලිපි ලේඛන ඒ මහතා ලබාදුන් A Dhana dios, 2/44, wantirua south, Victoria 3152, Australia යන ලිපිනයට තැපැල් කළද දින 18කට පසු බාරදීමට නොහැකි ලිපියක් සේ ඒ ලිපිය නැවත සමුද්‍රිකා වෙත ලැබී ඇත. ඒ මහතා දී තිබූ දුරකථන අංකයද ප්‍රතිචාර නොදක්වන තත්ත්වයක පවතින බව ඇය පවසයි.

එම අවස්ථා දෙක එලෙස මඟහැරී ගියද සමුද්‍රිකා සන්නසට එවන ලද ලිපියක් පෙබරවාරි කලාපයේ පලකිරීමෙන් පසු ඇයට උදව් කිරීමට තවත් කීප දෙනෙක් ඉදිරිපත්වී තිබිණ. ඒ අතරින් ඕස්ට්‍රේලියාවේ වෙසෙන කුමාරි පද්මපෙරුම සහෘද මහත්මිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය අංශයේ ''චන්ද්‍රා මැඩම්'' මහත්මිය ඇයට මුදල් පරිත්‍යාග ලබාදුන් බවත්, නිවාඩුවට ගෙදර ගිය පසු අම්මා උකස් තබා ඇති කුඹුර බේරාගන්නා බවත් ස්තුති පූර්වකව සමුද්‍රිකා අපට දන්වා තිබේ. (තමන්ටත් අම්මාටත් අවුරුද්දක බත සාදාදෙන්නේ මේ කුඹුරෙන් බවත්, පියා මියගියදා සිට එය වපුරන්නේ අම්මා බවත් ඇය අපට මීට පෙර කියා තිබුණි.)

සමුද්‍රිකා පිළිබඳ කාරුණික අවධානය යොමු කළ සෙසු සහෘද මහත්ම මහත්මීන්ට ඈ දුරකථනයෙන් සම්බන්ධ කරගැනීමට නොහැකිව ඇත්තේ ඇය සතියේ දිනවල දහවල් කාලයේ විශ්වවිද්‍යාලයේ දේශනවලට සහභාගිවන බැවින් සහ හෝ ඇය වෙසෙන ප්‍රදේශයට දුරකථන සන්නිවේදනයේ පවතින අපහසුතා හේතුවෙන් විය හැකිය. එබැවින් ඒ සහෘදයන්ටත් ඇයගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා උදව් කිරීමට කැමැති තවත් අය වෙත්නම් ඔවුන්ටත් පහසුවක් වන සේ ඇය සතු බැංකු ගිණුමේ විස්තරය පහත පළකරමු.

මහජන බැංකුව/00115-ගලේවෙල ශාඛාව/ඉතිරි කිරීමේ ගිණුම් අංකය 115-2-001-1-0018456/H.S.T. Ihala gedara

ඇයට පරිගණකයක් පරිත්‍යාග කිරීමට හැකියාවක් ඇති සහෘදයකු වේ නම් එය ''සන්නස'' කාර්යාලයට බාරදිය හැකිය.

# Harmony Day 2014

Sri Lanka Unites Australia (SLUA) is proud to support Harmony Day 2014 this year which will be held on the 23rd of March 2014 at Wesley College from 12-6pm.

It is organised by a number of dedicated individuals of various backgrounds who are committed to change the story of Sri Lankans from a culture of divisiveness towards one of hope, trust and togetherness both in Sri Lanka and within the diaspora in Australia,

To this end they have organised HARMONY DAY- a day of culture, food and sport to celebrate our diversity as Sri Lankans living in Australia.

SLUA warmly invite you, your family and friends to come and experience delicious food, amazing performances, inspiring speakers and of course an exciting cricket match to finish off the day in true Sri Lankan fashion. This event is completely FREE and open to the public so come down to Wesley College on the 23rd of March so we can write a new story for the next generations of Sri Lankans together.

රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර **www.thisara.com**




